මැතිවරණ කොමිෂන් සභාව
29 APR 2026
නීති අංශය
රාජගිරිය

# ලක්ජන පෙරමුණ ව්‍යවස්ථාව

මැතිවරණ කොමිෂන් සභාව
2 9 APR 2026
නීති අංශය
රාජගිරිය

Reg. EC/RPP/1988/18

# ලක්ජන පෙරමුණ

## ව්‍යවස්ථාව

1. 2008 මැයි 01 දින පවත්වනු ලැබූ මහා සම්මේලනයේ දී, සම්මත කරන ලදි.

2. 2011 ජනවාරි 30 දින පැවති ජාතික මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය

3. 2013 දෙසැම්බර් 22 දින පැවති ජාතික මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය

4. 2015 මාර්තු 08 දින පැවති ජාතික මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය

5. 2019 පෙබරවාරි 24 දින පැවති ජාතික මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය

6. 2022 මැයි 01 දින පැවති ජාතික මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය


ප්‍රධාන කාර්යාලය

390, රත්ගල්ගොඩ වත්ත,

5Km කණුව, ගල්තුඩුවල,

ගෝනගලපුර. (80502)

29 APR 2026
රාජගිරිය

## ලක්ජන පෙරමුණ පක්ෂය
## අරමුණු, ප්‍රතිපත්ති සහ ඉදිරි දැක්ම

### අරමුණු

වර්තමානය වන විට. අප සදාදරණීය මාතෘ භූමිය මුහුණ දී සිටින්නේ අන් කවරදාවත් නොවූ තරම් ඛේදවාචකයකටය. ඉතිහාසයේ මහා පරාක්‍රමබාහු රජු සමයේදී මහා සශ්‍රීක "පෙරදිග ධාන්‍යාගාරය" වූ ලංකා භූමිය අද ලෝකයාට ඩොලර් බිලියන ගණන් ණය ගැති වී බංකොලොත් භාවයට පත්වී තිබේ.

මේ ඛේදජනක තත්වයට මාතෘ භූමිය ඇද දැමීම සම්බන්ධයෙන්, නිදහසින් පසු ශ්‍රී ලංකාව පාලනය කළ සියලු ආණ්ඩු වගකිව යුත්තේය. විශේෂයෙන් 2009 යුද ජයග්‍රහණයෙන් අනතුරුව මහා පරිමාණයෙන් ණය ගෙන ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල වංචාව සහ අනෙකුත් තත්වයන් හේතුවෙන් ඒවායේ ප්‍රතිලාභ වලට වඩා රටට සිදු වූ හානිය අධිකය. ඇතැම් ව්‍යාපෘති සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබේ.

අවාසනාවකට ලංකාවේ මහජනතාව තට්ටුමාරු ක්‍රමයට බලය ලබා දෙන්නේ ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලන බලවේග දෙකකටය. එනමුත් මේ බලවේග දෙකම අසාර්ථක බව ඉතිහාසය නැවත නැවතත් ඔප්පු කර තිබේ. මුග්ධ ලෙස පැළඳගෙන සිටින පක්ෂ පාට කන්නාඩි නිසා බොහෝ දෙනාට මේ ජාතික ව්‍යසනය නොතේරේ.

ශ්‍රී ලංකාවේ පරිහානියට ප්‍රධාන හේතුව ලංකාවේ දේශපාලන මාෆියාව හා තුන්වන පංතියේ දේශපාලන සංස්කෘතියයි. බලයත්. කාමයත් ධනයත්, තමාට ලැබෙන වරදානත් ගැන පමණක් සිතන. මේ දූෂ්ට දේශපාලන බලවේග වහා පරදවාලීම මෙබිම උපත් සියලු සුජාත දූ දරුවන්ගේ යුතුකම හා වගකීම වන්නේය.

එය වටහා ගත යුතුය. ඒ සඳහා පෙරට ආ යුතුය.

ආර්ථික අර්බුදයට අමතරව රට මුහුණ පා ඇති අර්බුද රාශියකි. කෘෂිකර්මාන්තය ඛේදජනක තත්වයකට ඇද වැටී තිබේ. පරිසර විනාශයන් උග්‍ර වී තිබේ. අපරාධ වැඩි වී තිබේ. තවත් අතකින් මත්ද්‍රව්‍ය රකුසා විසින් තරුණ පරපුර ගිල ගනිමින් පවතී. ඒ ජාතික අපරාධ වලට දූෂ්‍ය දේශපාලකයන්ගේ ආශිර්වාදය නොඅඩුව ලැබෙන බව නවදුරටත් රහසක් නොවේ.

මේ සියලු අර්බුද වලින් රට ගොඩ ගැනීම පහසු නැත.

ශ්‍රී ලංකව ගොඩනැගීම උදෙසා වූ පළමු වගකීම ඇත්තේ ජනතාව අතේය. ඒ වගකීම ඉටුකරලීම උදෙසා ජනතාව වඩා උගත් - වැදගත් - නිහතමානී කාරුණික ජනතා නියෝජිතයන් පත් කර ගැනීමට පියවර ගත යුත්තේය. ලක්ජන පෙරමුණ ඒ

සඳහා දේශපාලන වේදිකාවක් නිර්මාණය කොට තිබේ. ඒ සත්කාර්ය සඳහා අප හා එක්වන ලෙස ඔබ වෙත ඇරයුම් කරන්නෙමු.

රට ගොඩනංවන්නේ කෙසේද?

මානවයා සිය දීර්ඝ වූත්, අඛණ්ඩ වූත් පරිනාමය සහ ප්‍රගමනය හරහා අද දැනුම පිළිබඳ උච්චතම අවස්ථාව එළැඹ තිබේ. ඒ නව දැනුම, විද්‍යාව හා තාක්ෂණයේ අසීමිත ප්‍රයෝජනයන් රටේ අභිවෘද්ධියත්, ජනතාවගේ සුබවිහරණය වැඩි කිරීම වෙනුවෙනුත් යෙදවීමට අපි ඇප කැප වී සිටින්නෙමු. දකුණු කොරියාව, ජපානය වැනි රටවල් දියුණු වූයේ විද්‍යා තාක්ෂණ දියුණුවට සහ නවෝත්පාදනයට (New Inventions) මුල්තැන ලබා දී කටයුතු කිරීමෙනි. අපද ඒ මග යා යුතු අතර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ / මෘදුකාංග ඉංජිනේරු තාක්ෂණයේ අභිවෘද්ධියට සුවිශේෂී අවධානයක් යොමු කළ යුත්තේය.

සැබෑ ජාතිමාමක රජයක් පිහිටුවා අප විසින් මහා සැලැස්මක් (master plan) ගොඩනංවා එය ක්‍රියාත්මක කළ යුත්තේය.

නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කොට, ස්වාධීන අධිකරණ හරහා යුක්තිය ඉටු කිරීම සාධාරණ සහ වේගවත් ක්‍රමයක් බිහි කළ යුතුය. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, රටේ සියලු පුරවැසියන්ට සාමයෙන් හා සමාදානයෙන් ජීවත් වීමට අවශ්‍ය පරිසරය අප නිර්මාණය කළ යුතුය.

ධනවාදය මගින් ඇති-නැති පරතරය පුළුල් වී සමාජය මත පවත්වා ඇති විඩාව (Depression) අවම කරලීමට අප පියවර ගත යුත්තේමය. ඒ උදෙසා මහා සුභසාධනයක් (Good Welfare System) ක්‍රියාත්මක කළ යුත්තේය.

විදේශ ආයෝජන ද හැකිතාක් ලබාගෙන, කම්හල් - කර්මාන්ත ගොඩනංවා, නිෂ්පාදන ආර්ථිකයක් ඇති කොට, අපනයන වැඩි දියුණු කොට, ධනෝත්පාදනය හරහා රට වැටී ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩ ගත යුතුය.

සංචාරක ව්‍යාපාරය තවත් දියුණු කොට ලෝකයේ ධනවතුන්ගේ සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානයක් බවට රට පත් කළ යුතුය.

R.A. ජයවීර මහතාගේ , රාජ්‍ය පාලනය හා සංවිධානය කෘතියේ 12 වෙනි පිටුවේ පහත කතාව කියැවේ.

"එක්තරා කැලෑ ගම්මානයක පාරක් අයිනට වී සිටි අලියෙක් එම පාරේ යන මිනිසුන් අල්ලා, උඩුබැලි අතට බිම හොවා මුහුණ උඩින් තම ඉදිරිපස කකුලක් ඔසවා තබාගෙන සිට, ටික වේලාවකින් හිස පාගා පොඩිකර මරා දැමීමට පටන් ගත්තේය. එබැවින් ගම් වැසියෝ එම පාර මග හැරියහ.

මේ ගැන නොදන්නා වෙනත් ගමක මිනිසෙක් කඳක්ද රැගෙන එම පාරෙන් පැමිණියේ අලියාගේ ග්‍රහණයට හසු විය. බිය නොවනු ලැබූ මිනිසා, බියෙන් ඇළලී ඇස් පියවී ගිය අනෙක් මිනිසුන් මෙන් නොව, ඇස් හැර අලියාගේ කකුල දෙස බැලිය. ඔහුට පෙනුණේ අලියාගේ කකුලේ ලොකු උලක් ඇනී පැසවා කකුල බිම තබන්නට බැරි තරම් වේදනාවක් ඇති වී තිබෙන බවය. ඔහු ධෛර්යය උපදවා ගෙන අතින් උල ඇද්දේය. උල ගැලවී ආවේය. තුවාලයෙන් ගැලූ සැරව ඔහුගේ මුහුණ වසාගෙන ගලා ගියෙන් ඔහුට කිසිවක් නොපෙනුණි.

අලියා මිනිසා ඔසවාගෙන අසල දිය දහරක් වෙත ගොස් මුහුණ සෝදා ගන්නට සලස්වා ඔහු ගෙන ආ කඳ එතැනට ගෙනැවිත් දුන්නේය. මගට බට මිනිසා නොපෙනී යන තෙක් අලියා කෘතගුණ පූර්වකව ඔහු දෙස බලා සිටියේය.

ඉහත සඳහන් කරන ලද මහියංගණ ප්‍රදේශයේ ජන කතාව අප මුහුණ දී ඇති තත්ත්වය හා අප කළ යුතු දේ තේරුම් ගැනීමට මග පෙන්වයි. මෙම කතාව අපට ගලපා ගැනීමේදී අලියා නම් මහජනයාය. නිදහසින් පසු කලින් කලට පාලනය භාරගත් ආණ්ඩු ජනතාව විඳින දුක තේරුම්ගෙන, එම දුකින් ජනතාව මුදවනු වස් තම යුතුකම් හා වගකීම් සපුරා ඉටු නොකළ නිසා (ඇනෑ - කන පියා සිටි නිසා ) අලියා (ජනතාව) විසින් ඔවුන් ඉවත් කරනු ලැබිය.

එනිසා දැන්වත් මහජනයා වෙත තම යුතුකම් හා වගකීම් මනාව ඉෂ්ට කිරීමේ භාරදූර කාර්යය කර ගන්නා පාලන තන්ත්‍රයක් අපි ජනිත කර ගත යුතුය.

## ප්‍රතිපත්ති

සිංගප්පූරුව තුන්වන ලෝකයේ රටක මට්ටමේ සිට පළමු ලෝකය මට්ටමේ රටක් දක්වා දියුණු කළ අග්‍රාමාත්‍ය ලී ක්වාන් යූ මහතා ඒ උදෙසා අනුගමනය කර ඇත්තේ ප්‍රධාන ප්‍රතිපත්ති තුනකි. ඒවා එනාහි

1. සුදුස්සාට සුදුසු තැන දීම. (Meritocracy)

2. ස්ථානෝචිත ප්‍රඥාවෙන් ප්‍රයෝගිකවාදීව කටයුතු කිරීම. (Pragmatism)

3. දූෂණයෙන් තොර අවංකභාවය (Honesty)

ලංකාව ගොඩනැංවීම උදෙසා ද මේ ප්‍රතිපත්ති අනුගමනය කිරීම අපේ ජනබල පක්ෂයේ අරමුණයි.

ආර්ථිකව සමෘද්ධිමත්වූත්, බලවත් වූත් රටක් ගොඩනංවා මාතෘ භූමියේ විනාශ වී ඇති ගෞරවය යළි පුනර්ස්ථාපනය කළ යුතුය. ඒ උදෙසා ශිෂ්ටසම්පන්න, උගත්,

ආචාරශීලී. විනය ගරුක. හා සමගි සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැංවිය යුතුය.

**ඉදිරි දැක්ම**

රාජ්‍යතන්ත්‍රයේ ස්වභාවය සහ නීතියේ පදනම මහජනතාවට සහ රටට ගැළපෙන ආකාරයට අලුතෙන් ප්‍රතිසංවිධානය කෙරෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් විය යුතුය යන ස්ථාවරයේ අපි සිටින්නෙමු.එහි වර්තමානයේ පවතිනවාට වඩා ශක්තිමත් මූලික අයිතිවාසිකම් රාමුවක් තිබිය යුතුය.

ශ්‍රී ලංකා රාජ්‍ය භෞමික හා දේශපාලනික ඛණ්ඩතාවයන් මත කැබලි වීමට ඇති ඉඩ ප්‍රස්ථා සහමුලින්ම වසා දමන්නෙමු. අපේ ජනබල පක්ෂය පෙනී සිටින්නේ නොබෙදුනු. ඒකීය රාජ්‍යක් වෙනුවෙන් බවට අපි සපථ කරන්නෙමු. දෙවුන්දර සිට පේදුරුතුඩුව දක්වා අහස්තලයේ ඵසැවෙන්නේ ජාතියේ අභිමානවත් සිංහ ධ්වජය පමණකි. එමෙන්ම ජාතිකත්වය මත හෝ ප්‍රාදේශීය හෝ ආගමික පදනමින් පවතින විවිධාකාර පුද්ගල නීති ලැබෙන පළමු අවස්ථාවේදී ම, අහෝසි කොට. ඒ වෙනුවට සමස්ත දේශයටම එක් නීති පද්ධතියක් හඳුන්වා දී "නීතියේ සමානාත්මතාව" යන්න අර්ථවත් කරන්නෙමු.

අධිකරණය, මැතිවරණ ක්‍රියාවලිය හා ජනමාධ්‍ය ස්වාධීනව පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම එනා ගොඩනගන අතර රාජ්‍ය සේවය දේශපාලකයන්ගේ ඇඟිලි ගැසීම් වලින් තොරව කරගෙන යාමට අදාළ පරිසරය නිර්මාණය කරන්නෙමු.

ආණ්ඩුව වූ කලී ආර්ථික සංවර්ධනයේ මඟ පෙන්වන්නා ද පහසුකම් සපයන්නා ද, බාධක ඉවත් කරන්නා ද පමණක් විය යුතුය. ආණ්ඩු බලය හොබවන්නන් "බලය" මහජනතාව උදෙසා මහජන භාරයක් (Public Trust) ලෙස තාවකාලිකව බලය හෙබවිය යුතු අතර බලයේ අයිතිකරුවා වීමට උත්සාහ නොකළ යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කළ යුත්තේය.

මිශ්‍ර ආර්ථිකයක් තුළ රාජ්‍ය ආයතන පෞද්ගලික අංශය සමඟ සාධාරණ හා සමාන කොන්දේසි යටතේ තරග කරමින් ආර්ථික ව්‍යාපාර සිදු කොට එහි ප්‍රතිලාභ ජන ජීවිතය යහපත් කරන්නට යොදා ගත යුතුය.

රට වැටී ඇති ආර්ථික අගාධයෙන් ගොඩ ගැනීමේ එක ක්‍රමවේදයක් ලෙස ජනතා මුදල් මංකොල්ල කා පොහොසත් වූ දේශපාලකයන් සහ  නිලධාරීන් සම්බන්ධයෙන් විශේෂ ආයතනයක් හරහා විමර්ශන පවත්වා ඔවුන්ට එරෙහිව නඩු විභාග පවත්වා උපරිම දඬුවම් පමුණුවා දූෂණයෙන් උපයා ගන්නා ලද මුදල් සහ දේපල රාජ්‍යසන්තක කිරීමට පියවර ගන්නෙමු.

ජනතා බදු මුදලින් ඉදිකරන කිසිදු ව්‍යාපෘතියක සමරු ඵලක වල දේශපාලකයන්ගේ නම් සඳහන් කිරීම සපුරා තහනම් කරන්නෙමු.

ලෝකයේ අන් දියුණු රටවල් සමඟ එක පෙළට අභිමානයෙන් සිටගත හැකි ජාතියක් බිහි කිරීමත්, කවුරුත් කාටත් ගරු කරන යුක්ති ගරුක දේශයක් නිර්මාණය කිරීමටත් අපි ඇප කැප වන්නෙමු.

ඒ සඳහා අවශ්‍ය වුවමනාව, ආත්ම ධෛර්යය, අවංකභාවය හා ජාතික හැඟීම අප වෙත නොඅඩුව තිබේ. දූෂණයෙන් වංචාවෙන් සහ අයුක්තියෙන් තොර සමෘද්ධිමත් සරු බිමක් සඳහා අප සමඟ එක්වන්න. අපේ උතුම් මාතෘභූමිය දිනන්නට ....!

- නාස්තිය, දූෂණය හා අල්ලස මෙරටින් තුරන් කරන්නෙමු.
- පරිසරය සුරැකීමට දැඩි අවධානයක් යොමු කරන්නෙමු.
- විද්‍යාත්මක කෘෂිකර්මාන්තය කෙරේ ගොවියා හරවන්නෙමු.
- දේශීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය උපරිම සහාය සහ ධෛර්යය ලබා දෙන්නෙමු.
- අයවැයේ ප්‍රමුඛතාවය ජාතික ආරක්ෂාව, අධ්‍යාපනයට හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ට ලබා දෙන්නෙමු.
- මෙරට ලාභදායක ලෙස නිපදවිය හැකි සියලු භාණ්ඩ පිටරටින් ගෙන්වීම තහනම් කොට ස්වදේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට අත දෙන්නෙමු.
- දුප්පත් භාවය මෙරටින් තුරන් කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා දෙන්නෙමු.
- කපටින්ගේ පොරොන්දු දේශපාලනයට සදහටම තිත තබන්නෙමු.

ව්‍යවස්ථාව — I වන පරිච්ඡේදය — පිටුව

මූලික කරුණු - 8

1. පක්ෂයේ නම
2. පක්ෂයේ නායකත්වය
3. පක්ෂ සාමාජිකත්වය
4. සාමාජික මුදල් - 9
5. සාමාජිකත්වය අලුත් කිරීම - 10
6. පක්ෂයේ සාමාජිකයන්ට අදාළ කොන්දේසි
7. පක්ෂ සාමාජිකයෙකු සතු අයිතිවාසිකම් සහ යුතුකම් - 11

II වන පරිච්ඡේදය

**1. පක්ෂයේ ව්‍යුහය**

i. ශාඛා සමිති - 13
ii. තරුණ සමිති - 14
iii. වෙනත් සංවිධාන
- ❖ හැඳින්වීම
- ❖ ශාඛා සමිති කිහිපයක සාමාජිකත්වය දැරීම - 15

iv. මැතිවරණ කොට්ඨාස සංවිධාන සහ නිලධාරී මණ්ඩලය
- ❖ හැඳින්වීම
- ❖ මැතිවරණ කොට්ඨාස සංවිධානයේ කාර්යභාරය - 16
- ❖ මැතිවරණ කොට්ඨාශ සංවිධායක සහ සභාපති - 17

v. මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය - 18
- ❖ හැඳින්වීම
- ❖ මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය සතු කාර්යභාරය - 19

vi. විනය මණ්ඩලය - 20

vii. දේශපාලන බල මණ්ඩලය - 21

දේශපාලන බල මණ්ඩලයේ සංයුතිය
- ❖ දේශපාලන බල මණ්ඩලයේ බලතල හා කාර්ය භාරය
- ❖ දේශපාලන බල මණ්ඩලයේ රැස්වීම් - 22

viii. මධ්‍යම කාරක සභාව - 23

- ❖ හැඳින්වීම
- ❖ මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වය අහෝසි වන ආකාරය
- ❖ මධ්‍යම කාරක සභාවේ බලතල සහ වගකීම්
- ❖ මධ්‍යම කාරක සභාව රැස්වීම සහ මූලාසනය - 24


## III පරිච්ඡේදය

මධ්‍යම කාරක සභා සහ දේශපාලන බල මණ්ඩල සභික සාමාජිකයෙකු සම්බන්ධ වෙනත් විධිවිධාන - 25

1. ධුරය අහෝසි වීම
2. දේශපාලන බල මණ්ඩලය හෝ මධ්‍යම කාරක සභා සභිකයෙකුගේ ධුර කාලය - 26
3. පුරප්පාඩු පිරවීම


## IV පරිච්ඡේදය

i. පක්ෂයේ සභාපති සහ ප්‍රධාන නිලධාරීන් - 27

1. පක්ෂයේ සභාපති
2. පක්ෂයේ ප්‍රධාන ලේකම්
3. පක්ෂයේ භාණ්ඩාගාරික - 28


## V වන පරිච්ඡේදය

අපේ ජනබල පක්ෂයේ මහා සම්මේලනය - 29

1. පක්ෂයේ මහා සම්මේලනය (කැඳවීම/මූලාසනය/කාලය)
2. පක්ෂයේ මහා සම්මේලනය සඳහා සහභාගි වන නියෝජිතයන් - 30
3. පක්ෂ මහා සම්මේලනයේ කාර්ය භාරය


## VI පරිච්ඡේදය

විශේෂ විධි විධාන - 32

(14)

මැතිවරණ කොමිෂන් සභාව
29 APR 2026
නීති අංශය
රාජගිරිය

# ලක්ජන පෙරමුණ ව්‍යවස්ථාව

## 1 වන පරිච්ඡේදය

<u>මූලික කරුණු</u>

1. පක්ෂයේ නම

(අ) ලක්ජන පෙරමුණ

(ආ) லக்ஜன பெரமுன

(ඇ) Lakjana Peramuna

i. පක්ෂයේ මැතිවරණ සළකුණ " ධජය" වන්නේය.

ii. පක්ෂයේ නිල වර්ණය රන්වන් පැහැය වන්නේය.

iii. පක්ෂයේ ප්‍රධාන කාර්යාලය - 390, රත්ගල්ගොඩ වත්ත,
5 Km කණුව, ගල්තුඩුව,
ගෝනගලපුර. (80502)

**2. පක්ෂ නායකත්වය**

පක්ෂයේ ප්‍රධාන තනතුරු 04 කි.

**01. සභාපති**

පක්ෂයේ සභාපතිවරයා පක්ෂයේ යාවජීව නායකයා වේ. පක්ෂයේ සභාපතිවරයා නිල බලයෙන් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සහ පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයේ සභාපතිවරයා ද වේ.

**02. මහලේකම්**

**03. නියෝජ්‍ය මහලේකම්**

**04. භාණ්ඩාගාරික**

**3. පක්ෂයේ සාමාජිකත්වය**

i. වයස අවුරුදු 16 සම්පූර්ණ වී ඇති පිරිමි/කාන්තා දෙපාර්ශවයේ ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට පක්ෂයේ සාමාජිකත්වය ඉල්ලුම් කළ හැක.

ii. ඒ උදෙසා අයදුම්පත්‍රයක් පුරවා භාරදිය යුතු අතර, පක්ෂයේ සාමාජික ගාස්තු ගෙවිය යුතුය.

iii. පක්ෂයට බැඳෙන සෑම කෙනෙක්ම එම අයදුම් පත්‍රයේ පහත සඳහන් දිවුරුමට අත්සන් කළ යුතුය. "මම පක්ෂයේ පොදු වැඩ පිළිවෙලට එකඟ වෙමි, ඒ අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කරමි. පක්ෂයට භක්තිමත් වෙමි, එහි තීරණයන් හා විධි විධානයන් ක්‍රියාවට නගමි."

iv. වෙනත් කිසිම දේශපාලන පක්ෂයක සාමාජිකයකු හෝ සාමාජිකාවකට ඇජ් ජනබල පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත නොහැක.

v. පක්ෂ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ දින සිට මාස 03ක කාලයක් ගතවන තෙක් ඔහු හෝ ඇය අර්ධ සාමාජිකයෙකු වශයෙන් සැලකේ.

ගතවන මාස 03ක අධීක්ෂණ සීමාව තුළදී මෙම සාමාජිකත්ව අපේක්ෂකයා සම්බන්ධයෙන් කිසියම් සාධාරණ විරෝධතාවක් පැන නොනැගුනහොත් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් ඔහු හෝ ඇය වෙතට පූර්ණ සාමාජිකත්වය පිරි නමනු ඇත. එතැන් සිට ඔහු පක්ෂයේ පූර්ණ සාමාජිකයෙකු වශයෙන් පිළිගැනේ.

<u>4. සාමාජික මුදල්</u>

i. සෑම සාමාජිකයෙකුම රු.100.00 ක වාර්ෂික මුදලක් ගෙවිය යුතුය.

ii. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සියලුම සාමාජිකයන් ද, ප්‍රාදේශීය සභා අපේක්ෂකයින් ද පක්ෂ සාමාජික ගාස්තුවට අමතර රු.1000.00 ක මුදලක් වාර්ෂිකව පක්ෂ අරමුදලට පිරිනැමිය යුතුය.

iii. පක්ෂයේ සියලුම ආසන සංවිධායකවරුන් පක්ෂ සාමාජික ගාස්තුවට අමතරව රු.5000.00 ක මුදලක් වාර්ෂිකව පක්ෂ අරමුදලට පිරිනැමිය යුතුය.

iv. පක්ෂයේ දේශපාලන බලමණ්ඩල සාමාජිකයන් පක්ෂ සාමාජික ගාස්තුවට අමතරව රු.10000.00 ක මුදලක් වාර්ෂිකව පක්ෂ අරමුදලට පිරිනැමිය යුතුය.

v. පළාත් පාලන ආයතන සඳහා මහජන ඡන්දයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිත මන්ත්‍රීවරුන් සිය මාසික වැටුපෙන් 5%ක් පක්ෂයේ අරමුදලට පිරිනැමිය යුතු වේ

vi. පළාත් පාලන ආයතනයක සභාපති, උප සභාපති, නගරාධිපති සහ උප නගරාධිපති තනතුරු සඳහා තේරී පත්වන පක්ෂයේ නියෝජිතයින් සිය මාසික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට පිරිනැමිය යුතු වේ.

vii. පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ අමාත්‍යවරයෙකු වශයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය මාසික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට පිරිනැමිය යුතු වේ.

viii. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය මාසික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට පිරිනැමිය යුතු වේ.

ix. පාර්ලිමේන්තුවේ ඇමතිවරයෙකු, නියෝජ්‍ය අමාත්‍යවරයෙකු, කථානායකවරයෙකු හෝ නියෝජ්‍ය කථානායකධුරයට පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය මාසික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට පිරිනැමිය යුතු වේ.

x. මීට අමතරව පක්ෂයේ සාමාජිකයන්, පක්ෂයේ නිලධාරීන් හා පක්ෂයේ මහජන නියෝජිතයින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් නියම කරනු ලබන අනුග්‍රහයන් පක්ෂය වෙත ලබා දීමට බැඳේ.

## 5. සාමාජිකත්වය අලුත් කිරීම

i. සෑම වර්ෂයකම මුල් තුන් (03) මාසය තුළදී සාමාජික මුදල් ගෙවීමෙන් එම වර්ෂය සඳහා වූ තම සාමාජිකත්වය දීර්ඝ කර ගත යුතුය.

ii. එම තුන් මාසය තුළ සාමාජික මුදල් නොගෙවීම පක්ෂ සාමාජිකත්වය අහෝසි වීමට හේතු වනු ඇත

iii. පක්ෂ සාමාජිකත්වය නොලැබූ පුද්ගලයෙකු මැතිවරණයකදී අපේ ජනබල පක්ෂයෙන් නාම යෝජනා අත්සන් කළ සැනින් ඔහු හෝ ඇය පක්ෂ සාමාජිකයෙකු වේ.

## 6. පක්ෂයේ සාමාජිකයන්ට අදාළ කොන්දේසි

i. පක්ෂ සාමාජිකයන් පක්ෂයේ ප්‍රතිපත්ති, දේශපාලන වැඩ පිළිවෙළ සහ පක්ෂයේ විනයට මුළුමනින්ම එකඟව ක්‍රියාකළ යුතුය.

ii. පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කළ යුතුය.

iii. සියලුම මැතිවරණ වලදී පක්ෂය විසින් නම් කරනු ලබන නියෝජිතයින්ට හෝ නියෝජිතයෙකුට උපරිම සහයෝගයක් ලබා දිය යුතුය.

iv. පක්ෂයේ කීර්තියට හානිකර නොවන අයුරින් සදාචාරාත්මක ලෙස සිය පෞද්ගලික ජීවිත පැවැත්ම ගෙන යා යුතු අතර සහ ආදර්ශමත්. හොරට්ටනිය. නිතිගරුක ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙසින් සමාජය තුළ ක්‍රියාත්මක විය යුතුය.

## 7. පක්ෂ සාමාජිකයෙකු සතු අයිතිවාසිකම් සහ යුතුකම්

i. පක්ෂයේ පූර්ණ සාමාජිකත්වය ලැබූ අයෙකුට පක්ෂ සාමාජිකත්වයේ සිට පක්ෂ නායකත්වය දක්වා වූ පක්ෂය තුළ. ඕනෑම නිලයකට, නිසි කාර්ය පටිපාටියට අනුව පත් කරනු ලැබීමට පූර්ණ අයිතිය ඇත්තේය.

ii. පක්ෂය තරඟ කරන ඕනෑම මැතිවරණයකදී පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් තරඟ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සෑම පක්ෂ සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

iii. සමාජයේ ඕනෑම ස්ථානයකදී, ඕනෑම කාර්යභාරයකදී පක්ෂය විසින් නම් කරන ලද විගස පක්ෂයේ නියෝජිතයෙකු වශයෙන් ක්‍රියාකිරීමට සෑම සාමාජිකයෙකුටම අයිතිවාසිකම් සහ යුතුකමක් ඇත්තේය.

iv. පක්ෂයේ ඉහළ බල මණ්ඩලයන් විසින් (මධ්‍යම කාරක සභාව, දේශපාලන බලමණ්ඩලය, දිස්ත්‍රික් සංවිධානය) ගනු ලබන්නා වූ යම් යම් තීරණ හෝ ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් සිය මතය පක්ෂ සභාපතිවරයා වෙත ලිඛිතව යොමු කිරීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

v. පක්ෂයේ ඕනෑම තරාතිරමක නිලධාරියෙකු, නිලධාරිනියක එසේත් නැත්නම් නායකයකු හෝ නායිකාවකගේ ක්‍රියා කලාපය පක්ෂයේ කීර්තියට, අභිවෘද්ධියට සහ පොදු සමගියට බාධාවක් යැයි හැඟේ නම් ඒ සම්බන්ධයෙන් නායකත්වයට සහ පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයට ලිඛිතව කරුණු දැක්වීමට සෑම සාමාජිකයෙකුටම අයිතියක් සහ යුතුකමක් ඇත්තේය.

vi. පක්ෂයේ උන්නතිය සඳහා උචිත වේ යැයි තමා විශ්වාසකරන යම් යෝජනාවක් ඇත්නම් එම යෝජනාව තමා නියෝජනය කරන ශාඛා සමිතියට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව, එය පක්ෂයේ ආසන බල මණ්ඩල වෙත යොමු කරවීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

vii. එමෙන්ම, සෑම විටකදීම ප්‍රජාතන්ත්‍රවාදීව බහුතරයේ මතය පිළිගෙන සාමූහික වගකීමෙන් කටයුතු කිරීමට සෑම සාමාජිකයෙකුටම යුතුකමක් ඇත්තේය.

viii. පක්ෂ සාමාජිකයන් , පළාත් පාලන ආයතන, පළාත් සභා, සහ පාර්ලිමේන්තුව වැනි ව්‍යවස්ථාදායක ආයතනයන්හි සභිකයන් ලෙස කටයුතු කරන අවස්ථාවන්හිදී, පක්ෂයේ එක්සත්භාවය, සාමූහික වගකීම සහ පක්ෂයේ කීර්ති නාමය පළුදු නොවී රැක ගැනීම උදෙසා එම සෑම නියෝජිතයෙකුටම වගකීමක් ඇත්තේය. තවද පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ නියෝග සහ මෙහෙයවීම් අනුව කටයුතු කිරීමට ඔවුන්ට වගකීමක් ඇත්තේය.

# II වන පරිච්ඡේදය

**<u>1. පක්ෂයේ ව්‍යුහය</u>**

අපේ ජනබල පක්ෂයේ ව්‍යුහය පහත දැක්වෙන මණ්ඩල වලින් සකස් විය යුත්තේය.

i. ශාඛා සමිති
ii. තරුණ සමිති
iii. වෘත්තීය සංවිධාන
iv. මැතිවරණ කොට්ඨාස සංවිධාන
v. මැතිවරණ දිස්ත්‍රික් සංවිධාන
vi. විනය මණ්ඩලය
vii. දේශපාලන බලමණ්ඩලය
viii. මධ්‍යම කාරක සභාව

උක්ත සංවිධානයන්ගේ ක්‍රියාකාරීත්වය පහත දැක්වෙන අයුරින් විය යුත්තේය.

**i. ශාඛා සමිති**

අ. සම් මැතිවරණ කොට්ඨාසයක (මැතිවරණ බල ප්‍රදේශයක) පිහිටි සෑම ග්‍රාම සේවා වසමක් තුළ ම අවම වශයෙන් පක්ෂයේ එක් ශාඛා සමිතියක් බැගින් පිහිටුවිය යුතුය.

ආ. ශාඛා සමිතියක් පිහිටුවීමට අවම වශයෙන් 15 දෙනෙකු සිටිය යුතුය. ඔවුන් සෑම අයෙකුම වයස අවුරුදු 16 සම්පූර්ණ විය යුතුය.

ඇ. මෙම සෑම ශාඛා සමිතියක්ම සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් 10 දෙනෙකු ඇතුළත් නිලධාරි මණ්ඩලයක් තෝරා පත්කර ගත යුතුය.

ඈ. එම සෑම ශාඛා සමිතියක්ම පිහිටුවීමේදී අවම වශයෙන් පක්ෂයේ දිස්ත්‍රික් නායක හෝ ආසන සංවිධායකවරයා එම රැස්වීම් වාරයට සහභාගී විය යුතුය.

ඉ. එසේ පිහිටුවා ගන්නා සෑම ශාඛා සමිතියකම සභාවාරයේ පූර්ණ වාර්තාවක්, නිලධාරි මණ්ඩල ලේඛනයක් සහ සාමාජික නම් සහ අත්සන් ලේඛන දෙකක්

සමගින් දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා හරහා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කළ යුතුය.

ඊ. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් එම ශාඛා සමිතිය පක්ෂයේ පිළිගත් ශාඛා සමිතියක් වශයෙන් දේශපාලන බල මණ්ඩලයේ අනුමැතිය සහිතව පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කරවීමට ක්‍රියා කළ යුතුයි.

## ii. තරුණ සමිති

අ. සෑම ග්‍රාමසේවා කොට්ඨාසයකම අවම වශයෙන් එක් තරුණ සමිතියක්වත් පිහිටුවිය යුතු අතර. ඒ සඳහා සාමාජිකයන් 15 දෙනෙකුවත් අවම සිටිය යුතුය.

ආ. මෙම තරුණ සමිතියක සාමාජික/ සාමාජිකාවන් වයස අවුරුදු 16ත් 35ත් අතර විය යුතුයි.

ඇ. සෑම තරුණ සමිතියකම සභාපති. උප සභාපති. ලේකම්. උප ලේකම්. භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත නිලධාරි මණ්ඩලයක් තෝරා පත් කර ගත යුතුය.

ඈ. මෙලෙස පිහිටුවාගන්නා සෑම තරුණ සමිතියකම සභාවාරයේ පූර්ණ වාර්තාවක්. නිලධාරි මණ්ඩලය සහ සාමාජික නම් සහ අන්සන් ලේඛණ වාර්තා දෙක බැගින් පක්ෂයේ තරුණ සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කළ යුතුය.

ඉ. ඉන්පසු. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් එම තරුණ සමිතිය පක්ෂයේ පිළිගත් තරුණ සමිතියක් වශයෙන් පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කළ යුතු අතර. ඒ සඳහා දේශපාලන. බලමණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ක්‍රියාකළ යුතුයි.

## iii. වෙනත් සංවිධාන

### හැඳින්වීම

රජයේ හෝ පෞද්ගලික ආයතන තුළ මෙන්ම විශ්ව විද්‍යාල වැනි අධ්‍යාපන ආයතන තුළ ද. පක්ෂයේ ශාඛා සමිති, තරුණ සමිති .ශිෂ්‍ය සමිති. සහ කාන්තා සමිති පිහිටුවිය හැක. නමුත් ඒ සඳහා පළමුව. පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.

අනුමැතිය ලද හොත් වෙනත් ඕනෑම ශාඛා/තරුණ/කාන්තා සමිතියක් පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමෙන් එම සමිතියද පක්ෂයේ ලියාපදිංචි සමිතියක් බවට පත් කළ හැක.

**ශාඛා සමිති කිහිපයක සාමාජිකත්වය දැරීම**

අ. කිසිදු පක්ෂ සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට එකවර එකම වර්ගයේ ශාඛා සමිති දෙකක සාමාජිකත්වය දැරිය නොහැක.

ආ. නමුත්, යම් පක්ෂ සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට එකම ග්‍රාම සේවා වසමක් තුළ එකිනෙකට වෙනස් වර්ග දෙකකට අයත් (ශාඛා/ තරුණ/ කාන්තා යන වර්ග තුන අතුරින්) සමිති දෙකක සාමාජිකත්වය දැරිය හැක.

ඇ. නමුත්, කිසිදු සාමාජිකයෙකු හෝ සාමාජිකාවක විසින් එක් ශාඛා සමිතියක යම් නිලයක් දරයි නම් අනිත් සමිතියේ කිසිදු නිලයකට පත් නොවිය යුත්තේය.

**iv. මැතිවරණ කොට්ඨාස සංවිධානය සහ නිලධාරි මණ්ඩලය**

**හැඳින්වීම**

(මෙහි මැතිවරණ කොට්ඨාසයක් යනුවෙන් හඳුන්වා ඇත්තේ පවත්නා මැතිවරණ කොට්ඨාසයකට අයත් බල ප්‍රදේශයයි.)

අ. මැතිවරණ කොට්ඨාසයක් තුළ පිහිටුවා ඇති සෑම ශාඛා/ තරුණ කාන්තා සමිතියකම සභාපති, ලේකම් යන තනතුරු දරන්නන් සිය නිල බලයෙන් මෙම කොට්ඨාස සංවිධානයේ සාමාජිකත්වය දරනු ඇත.

ආ. අදාළ මැතිවරණ කොට්ඨාසය තුළ ඇති පළාත් පාලන ආයතනයන්හි මහජන නියෝජිතයන් වශයෙන් තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයන් සහ මැතිවරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිය දරණ පළාත් සභා සඳහා තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයන් සිය නිල බලයෙන් මැතිවරණ කොට්ඨාස සංවිධානයේ සාමාජිකත්වය දරනු ඇත.

ඇ. එම මැතිවරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිය දරන්නා වූ ද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නා වූ ද පක්ෂයේ සාමාජික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටියි නම් ඔහු සිය නිල බලයෙන් එම සංවිධානය නියෝජනය කරන අතර, ඔහු එම සංවිධානයේ සභාපති පදවිය දැරිය යුත්තේය. ඔහු එම මැතිවරණ කොට්ඨාසයේ සංවිධායකවරයාද වන්නේය.

ඈ. එම මැතිවරණ කොට්ඨාසය තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු නොමැති අවස්ථාවලදී පක්ෂයේ සභාපතිවරයා විසින් එම මැතිවරණ කොට්ඨාසය සඳහා සංවිධායකවරයෙකු පත්කළ යුතු අතර, එවැනි අවස්ථාවකදී ඔහු නිල බලයෙන් එම මැතිවරණ කොට්ඨාස සංවිධානයේ සභාපතිවරයා ද වන්නේය.

ඉ. මීට අමතරව, පක්ෂයේ දේශපාලන බලමණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී 10 දෙනෙකුට නොවැඩි සාමාජිකයන් ප්‍රමාණයක් මැතිවරණ කොට්ඨාස සංවිධානයේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන්නන් එම මැතිවරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, නිලධාරි මණ්ඩලයට පත්වීමට අවස්ථාවක් ඔවුන් හට නොමැත.

ඊ. මැතිවරණ කොට්ඨාස සංවිධානය පහත දැක්වෙන නිලධාරි මණ්ඩලයෙන් සමන්විත විය යුත්තේය.

උ. සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් (11)දෙනෙකු එම නිලධාරි මණ්ඩලයට ඇතුළත් විය යුතුය.

ඌ. මෙම නිලධාරි මණ්ඩලය එම මැතිවරණ කොට්ඨාසය තුළ පක්ෂයේ ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

මැතිවරණ කොට්ඨාස සංවිධානයේ කාර්යභාරය

අ. මෙම සංවිධානය අදාළ මැතිවරණ කොට්ඨාසය තුළ පක්ෂයේ සියලු කාර්යයන් සපුරාලිය යුතුය. පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය විසින් පවරනු ලබන්නා වූ පක්ෂයේ ඕනෑම දේශපාලන අවශ්‍යතාවයක් ඉටු කිරීමට මෙම සංවිධානය බැඳේ .

ආ. පක්ෂය ඕනෑම මැතිවරණයකට මුහුණ දෙන අවස්ථාවකදී පක්ෂයේ මැතිවරණ ක්‍රියාවලිය සඳහා මැතිවරණයට පෙර මාස 02ක කාලය තුළදී පූර්ණ කාලීන ක්‍රියාකාරිකයන් අවම වශයෙන් 15 දෙනෙකුගේවත් සේවය පක්ෂය වෙතට ලබා දීමට සෑම මැතිවරණ කොට්ඨාස සංවිධානයක්ම ක්‍රියාකළ යුතුය.

ඇ. මෙම සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව පක්ෂයේ කාර්යයන් සඳහා අරමුදලක් ගොඩනැගීමට බලය තිබේ.

ඈ. මෙම මැතිවරණ කොට්ඨාස සංවිධානය අවම වශයෙන් මාස 04කට වරක්වත් රැස්විය යුතු අතර, එම සංවිධානයේ ක්‍රියාකාරී බලමණ්ඩලය මාස 03කට වරක්වත් රැස්විය යුත්තේය. එම සෑම රැස්වීමකම වාර්තාවක පිටපතක් අදාළ සංවිධානයේ ලේකම්වරයා විසින් පක්ෂ මූලස්ථානයට එවිය යුතුය.

ඉ. අදාළ මැතිවරණ කොට්ඨාසය තුළ සෑම ශාඛා/තරුණ/කාන්තා සමිති වලට අයත් සියලුම පක්ෂ සාමාජිකයන් සම්බන්ධයෙන් සොයා බැලීමෙන් ඔවුන්ගේ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ලැබෙන ලිඛිත පැමිණිලි සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට අවශ්‍ය වන්නේ නම් එම ලිඛිත තොරතුරු පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට සහ පක්ෂයේ විනය මණ්ඩලයට යොමු කිරීමට ක්‍රියාකාරී මණ්ඩලයේ සභාපතිවරයා වග බලා ගත යුතුය.

ඊ. මෙම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයේ සාමාජිකයෙකුට එරෙහිව යම් විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ වෙනයම් පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ වෙනයම් පැමිණිල්ලක් ඇත්නම් එය පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට සහ පක්ෂයේ විනය මණ්ඩලයට යොමු කිරීමට ඕනෑම සාමාජිකයෙකුට අයිතිය ඇත.

උ. මෙම සංවිධානය වෙනුවෙන් නිකුත් කරන සියලු ලිපි සංවිධානයේ සභාපතිවරයාගේ (මැතිවරණ කොට්ඨාසයේ සංවිධායකවරයාගේ) අනුමැතිය සහිතව සංවිධානයේ ලේකම්වරයා විසින් නිකුත් කළ යුත්තේය.

**මැතිවරණ කොට්ඨාස සංවිධායක හා සභාපති**

**හැඳින්වීම**

අ. මැතිවරණ කොට්ඨාස සංවිධායකවරයා සිය නිල බලයෙන් පක්ෂයේ මැතිවරණ කොට්ඨාස සංවිධානයේ සභාපතිවරයාද වන්නේය.

ආ. යම් මැතිවරණ කොට්ඨාසයක් තුල පක්ෂයේ සාමාජිකයකු වන වයස අවුරුදු 35 ට අඩු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටී නම් ඔහු මැතිවරණ කොට්ඨාස සංවිධානයේ සභාපති ධුරයට අමතරව මැතිවරණ කොට්ඨාස තරුණ සංවිධානයේ සභාපතිධුරයට සිය නිල බලයෙන් තේරී පත් වේ. මෙවන් අවස්ථාවකදී පක්ෂයේ සභාපතිවරයාට ඒ පිළිබඳව සිය අභිමතය පරිදි තීරණයක් ගැනීමට බලය තිබේ.

ඇ. යම් මැතිවරණ කොට්ඨාසයක් තුළ පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් ස්ථිර පදිංචිය දරණ අවස්ථාවකදී පක්ෂයේ සභාපතිවරයා විසින් සංවිධායකවරයා නම් කරනු ඇත.

ඈ. මැතිවරණ කොට්ඨාසය තුළ පක්ෂයේ සියලු කටයුතු පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචාරක කටයුතු මෙහෙයවීම සංවිධායකවරයා සතු වගකීම වේ.

ඉ. තමා භාරකම දරණ මැතිවරණ කොට්ඨාසයේ පක්ෂ ක්‍රියාකාරීත්වය සම්බන්ධ සවිස්තර වාර්තාවක් සෑම මාස තුනකට (03) වරක්ම මැතිවරණ කොට්ඨාසයේ සංවිධායකවරයා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට ලබා දිය යුතුය.

ඊ. මැතිවරණ කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වන පක්ෂයේ අනිකුත් සංවිධානයන් (තරුණ/ කාන්තා/ ශිෂ්‍ය) සහ පක්ෂයට අනුබද්ධ අනිකුත් සංවිධානයන්හි ක්‍රියාකාරීත්වයන් සොයා බැලීමට හා ඒවා පක්ෂයේ සමස්ත ක්‍රියාවලිය සමග ඒකාබද්ධව පවත්වාගෙන යාම සංවිධායකවරයා සතු වගකීමකි.

උ. යම් මැතිවරණයකදී මැතිවරණ කොට්ඨාස සංවිධායකවරයා මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමට අවකාශ නොලැබුවහොත් පක්ෂය විසින් නම් කරනු ලබන මැතිවරණ අපේක්ෂකයාට සම්පූර්ණ සහය ලබා දීමට සංවිධායකවරයා බැඳී සිටී.

ඌ. මැතිවරණ කොට්ඨාස සංවිධායකවරයෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, විනය උල්ලංඝනය කරනු ලැබූ විටකදී හෝ ඔහුගේ ක්‍රියාකාරීත්වය පක්ෂයේ පොදු සමගියට, පක්ෂයේ දේශපාලන මතවාදී එක්සත් භාවයට සහ හෝ පක්ෂයේ කීර්තියට හානි කර යැයි ඒත්තු යන විටකදී පක්ෂයේ සභාපතිවරයාට සංවිධායකවරයා ඉවත් කළ හැකිය. ඔහුගේ සභාපතිධුරයද එයින් අහෝසි වේ.

## v. මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය

### හැඳින්වීම

අ. මෙහි මැතිවරණ දිස්ත්‍රික්කය යනුවෙන් හඳුන්වනු ලබන්නේ පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ හඳුන්වා දෙනු ලැබ ඇති මැතිවරණ බල ප්‍රදේශයයි.

ආ. මැතිවරණ දිස්ත්‍රික්කයක් තුළ පිහිටා ඇති මැතිවරණ කොට්ඨාස සංවිධානයන්හි ක්‍රියාකාරී මණ්ඩලයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන නිලධාරීන් නිලදරනා සිය නිල බලයෙන් මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයන් වශයෙන් පත් වේ.

ඇ. එම මැතිවරණ දිස්ත්‍රික්කයේ පදිංචි ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු, නගර සභාවක නගරාධිපතිවරයෙකු සහ උප නගරාධිපතිවරයෙකු, පළාත් සභාවක හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ මන්ත්‍රීවරියක පක්ෂයේ සාමාජිකයෙකු වන අවස්ථාවකදී ඔහු හෝ ඇය නිල බලයෙන් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයෙකු වන්නේය.

ඈ. පක්ෂයේ සභාපතිවරයා විසින් මැතිවරණ දිස්ත්‍රික්කයන් සඳහා දිස්ත්‍රික් සංවිධායකවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු නිල බලයෙන් මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයේ සභාපතිවරයාද වන්නේය. එසේ පත් කරනු ලබන දිස්ත්‍රික් සංවිධායකවරයා එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුත්තේය.

ඉ. මෙම දිස්ත්‍රික් සංවිධානය සඳහා එහි සාමාජිකයන් විසින් පහත සඳහන් නිලධාරි මණ්ඩලය පත් කර ගත යුත්තේය. සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් දහ දෙනෙකු (10) ට ට ඇතුළත් විය යුතුය.

ඊ. මෙම නිලධාරි මණ්ඩලය දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලය යනුවෙන් නම් කෙරේ. එය අදාළ මැතිවරණ දිස්ත්‍රික්කයේ පක්ෂයේ ප්‍රධානතම ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

උ. මෙම සංවිධානයේ ලේකම් පක්ෂයේ දිස්ත්‍රික් ලේකම්වරයා වශයෙන් හැඳින්වෙනු ඇත.

<u>මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය සතු කාර්යභාරය</u>

අ. මෙම සංවිධානය අදාළ මැතිවරණ දිස්ත්‍රික්කය තුළ පක්ෂයේ සියලු කාර්යයන් මෙහෙයවීමට සහ ඉටු කිරීමට වගකීමෙන් බැඳී ඇත්තේය. පක්ෂයේ දේශපාලන බලමණ්ඩලය විසින් පවරනු ලබන්නා වූ පක්ෂයේ සියලුම දේශපාලන අවශ්‍යතාවන් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පක්ෂයේ අනිකුත් පහළ සංවිධාන වලට පැවරීමටත් ඒවා නිසි පරිදි අධීක්ෂණය කිරීමටත් දිස්ත්‍රික් සංවිධානය බැඳී ඇත්තේය.

ආ. මෙම සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව පක්ෂයේ කාර්යයන් සඳහා දිස්ත්‍රික් අරමුදලක් ගොඩ නැගීමට මෙම සංවිධානයට බලය ඇත

ඇ. මෙසේ ගොඩ නගනු ලබන අරමුදල් සම්බන්ධව සම්පූර්ණ අයවැය වාර්තාවක් වාර්ෂිකව දිස්ත්‍රික් සංවිධානයේ මහ සභා රැස්වීමකදී සම්මත කොට එහි පිටපතක් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙත යොමු කළ යුතුය.

ඈ. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන අනිකුත් මැතිවරණ කොට්ඨාස සංවිධාන සතු අරමුදල් පක්ෂයේ පොදු අවශ්‍යතාවයකදී දිස්ත්‍රික් සංවිධානය වෙත ලබා ගැනීමට හැකියාව ඇත. ඒ සඳහා පළමුව දිස්ත්‍රික් සංවිධානයේ යෝජනාවක් සම්මත විය යුතු අතර, ඉන්පසු එම සම්මත වූ යෝජනාව පක්ෂයේ දේශපාලන බලමණ්ඩලය වෙත යොමු කළ යුතුය. ඒ සඳහා එහි අනුමැතිය ලද හොත් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දේශපාලන බලමණ්ඩලයේ එම

අනුමැතිය ලිඛිතව සෑම මැතිවරණ කොට්ඨාස සංවිධායකයන් වෙතම යොමු කළ යුත්තේය. එම තීරණය අනුව ක්‍රියාත්මක වීමට මැතිවරණ කොට්ඨාස සංවිධායකයන් බැඳී සිටින අතර, එම තීරණය ගනු ලැබූ හේතුව මැතිවරණ කොට්ඨාස සංවිධායකයන්ට පැහැදිලි කිරීමට දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලය බැඳී සිටී.

ඉ. පළාත් පාලන ආයතන සඳහා පැවැත්වෙන මැතිවරණ වලදී සහ පළාත් සභා සඳහා පැවැත්වෙන මැතිවරණ වලදී පක්ෂයේ අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස සංවිධාන මඟින් සහ දිස්ත්‍රික්කය තුළ පක්ෂයේ ශාඛා සමිති වෙතින් නාම යෝජනා කැඳවීමට දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලයට බලය ඇත.

ඊ. එම නාම යෝජනා පරීක්ෂාකර බලා ඊට තම සංවිධානයේ නිර්දේශයන් ඇතුළත් කර පක්ෂයේ නාම යෝජනා මණ්ඩලය වෙතට යොමු කිරීමට දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී මණ්ඩලයට බලය ඇත. එම මැතිවරණ සඳහා ඉදිරිපත් කරන අපේක්ෂකයින් තීරණය කිරීමේදී දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලයේ නිර්දේශයන්ට මුල් තැනක් ලැබෙන පරිදි පක්ෂයේ ඉහළ මණ්ඩල ක්‍රියාත්මක විය යුත්තේය.

**<u>vi. විනය මණ්ඩලය</u>**

අ. විනය මණ්ඩලය පක්ෂ සභාපති ඇතුළු 05 දෙනෙකුගෙන් සමන්විත වේ.

ආ. පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකු, සංවිධායකයක් හෝ නිලධාරියෙකු සම්බන්ධයෙන් පක්ෂයේ සාමාජිකයෙකු හෝ සංවිධායකයක් විසින් හෝ කරනු ලබන ලිඛිත පැමිණිල්ලක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා පක්ෂයේ සභාපතිවරයා වෙත ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට මෙම කමිටුව ක්‍රියා කළ යුතුය.

ඇ. පක්ෂයේ සභාපතිවරයා විසින් එම පක්ෂ සාමාජිකයා නිලධාරියා හෝ පක්ෂයේ සංවිධායකයක් සම්බන්ධයෙන් සිය තීරණය ගත යුත්තේ එම නිර්දේශයන් පදනම් කර ගනිමිනි.

ඈ. තීරණ ගැනීමේ දී විනය මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු විනය මණ්ඩල සභිකයින් දෙදෙනෙකු සිටිය යුතුය.

vii. දේශපාලන බල මණ්ඩලය

## දේශපාලන බල මණ්ඩලයේ සංයුතිය

අ. දේශපාලන බල මණ්ඩලය සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

ආ. පක්ෂයේ සභාපති, මහලේකම්, නියෝජ්‍ය මහලේකම් සහ භාණ්ඩාගාරික නිල බලයෙන් දේශපාලන මණ්ඩලයේ සාමාජිකයන් වේ.

ඇ. එහි අනෙකුත් සාමාජිකයන් තිදෙනා පත් කිරීමේ බලය සභාපති සතුවේ.

## දේශපාලන බල මණ්ඩලයේ බලතල හා කාර්යභාර්ය

අ. පක්ෂයේ ප්‍රතිපත්ති සහ පක්ෂයේ දේශපාලන තීරණ සම්බන්ධයෙන් මෙම මණ්ඩලයේ සාකච්ඡා කොට තීරණ ගනු ඇත.

ආ. පක්ෂයට අනුබද්ධ ඕනෑම සංවිධානයක, පක්ෂයේ ඕනෑම ශාඛා සමිතියක නිලධාරියෙකුගේ හෝ සාමාජිකයෙකුගේ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්තීන්ට, පක්ෂ විනයට, පක්ෂයේ පොදු සමගියට සහ පක්ෂයේ දියුණුවට බාධාවක් වේ යැයි දේශපාලන බල මණ්ඩලයට හැඟෙන ඕනෑම මොහොතක, එම නිලධාරියා හෝ සාමාජිකයා විනය මණ්ඩලය ඉදිරියට කැඳවීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත. විනය මණ්ඩලය තම පරීක්ෂණයේ නිර්දේශය දේශපාලන මණ්ඩලය වෙත ලබා දුන් පසු උක්ත කරුණ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

ඇ. එම අන්දමින් යම් සාමාජිකයෙකුගේ, නිලධාරියෙකුගේ හෝ සංවිධානයක වැඩ කටයුතු තහනම් කරනු ලැබූ අවස්ථාවකදී පක්ෂ යාන්ත්‍රණයේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ බලය පක්ෂයේ දේශපාලන බලමණ්ඩලය විසින් යෝජනා කළ යුතු අතර එම යෝජනා මධ්‍යම කාරක සභාවෙන් අනුමත විය යුතුය.

ඈ. පක්ෂයේ පහළ සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන ඇටමුදල් පක්ෂයේ පොදු කාර්යයන් සඳහා අවශ්‍ය වේ යැයි හැඟෙන විටකදී ඒවා ලබාගෙන ඒ පොදු කාර්ය උදෙසා වැය කිරීමට පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයට බලය ඇත. නමුත්, එවන් අවස්ථාවකදී එම තීරණය ගැනීමට

(7)

හේතු වූ කරුණු පහළ සංවිධානයන්ට පැහැදිලි කිරීමට දේශපාලන බලමණ්ඩලය වගකීමෙන් බැඳී සිටී.

ඉ. පක්ෂයේ දේශපාලන ගමන් මාර්ගය සහ පක්ෂයේ දේශපාලන දර්ශනය සහ පක්ෂයේ දේශපාලන තීරණයන් සම්බන්ධයෙන් දේශපාලන බල මණ්ඩලයේදී සාකච්ඡා කෙරෙනු ඇත.

ඊ. පක්ෂය වෙනුවෙන් නිකුත් කරනු ලබන සියලුම ප්‍රකාශන, පුවත්පත් නිවේදන, ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩ සටහන් සඳහා ඉදිරිපත් කිරීම ආදියේදී තීරණ ගැනීමේ බලය දේශපාලන බල මණ්ඩලය සතුය.

උ. පක්ෂ සාමාජිකයන්, පළාත් පාලන ආයතන, පළාත් සභා, සහ පාර්ලිමේන්තුව වැනි ව්‍යවස්ථාදායක ආයතනයන්හි සභිකයන් ලෙස කටයුතු කරන අවස්ථාවන්හිදී, පක්ෂයේ ඒකස්සත්භාවය, සාමූහික වගකීම සහ පක්ෂයේ කීර්ති නාමය පලුදු නොවී රැක ගැනීම උදෙසා එම සෑම නියෝජිතයෙකුටම වගකීමක් ඇත්තේය. තවද පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ මගපෙන්වීම් අනුව කටයුතු කිරීමට ඔවුන්ට වගකීමක් ඇත්තේය.

ඌ එසේ ක්‍රියා නොකරන දේශපාලන මණ්ඩලයේ තීරණයන්ට අවනත නොවන ඕනෑම මහජන නියෝජිතයෙකු විනය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයට බලය ඇත.

එ පක්ෂය වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම තීරණය කිරීමේ බලය දේශපාලන බල මණ්ඩලය සතු වේ.

## දේශපාලන බල මණ්ඩලය රැස්වීම්

අ. පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය අවම වශයෙන් මාස 04කට වරක්වත් රැස්විය යුතුය.

ආ. එහි මූලාසනය පක්ෂයේ සභාපතිවරයා දැරිය යුතුය.

ඇ. පක්ෂයේ සභාපතිවරයාට නැංගෙන ඕනෑම අවස්ථාවක පක්ෂයේ දේශපාලන බල මණ්ඩල රැස්වීම කැඳවිය හැකිය.

viii. මධ්‍යම කාරක සභාව

**හැඳින්වීම**

මධ්‍යම කාරක සභාව පක්ෂ මහලේකම්ට අමතරව පක්ෂ සාමාජිකයන් 08 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

**පක්ෂයේ මධ්‍යම කාරක සභාවට**

1. පක්ෂයේ සභාපති

2. පක්ෂයේ මහලේකම්

3. නියෝජ්‍ය මහලේකම්

4. භාණ්ඩාගාරික

යන අය නිල බලයෙන් පත්වනු ඇත. ඉතුරු 05 දෙනා පත් කිරීමේ බලය පක්ෂ සභාපතිවරයා සතු වේ.

**මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන ආකාරය**

පක්ෂයේ ප්‍රතිපත්ති වලට පටහැනිව ක්‍රියාකිරීම හෝ පක්ෂ විනය උල්ලංඝනය කරනු ලැබ ඇති විටෙක හෝ පක්ෂයේ උන්නතියට, පක්ෂයේ පොදු සමගියට, පක්ෂයේ කීර්තියට බාධාවන අයුරින් ක්‍රියාත්මක වන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් පක්ෂයේ විනය මණ්ඩලයට, පක්ෂයේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය සහිතව ලැබෙන ලිඛිත පැමිණිල්ලක් අනුව එම සභාව විසින් පවත්වනු ලැබූ විධිමත් පරීක්ෂණයක නිර්දේශයක් මත පක්ෂයේ සභාපතිවරයාට මධ්‍යම කාරක සභිකයෙකු එම ධුරයෙන් නෙරපා දැමිය හැක.

**මධ්‍යම කාරක සභාවේ බලතල හා වගකීම්**

අ. අපේ ජනබල පක්ෂයේ අභ්‍යන්තර සංවිධාන සතු බලතල අනුව මධ්‍යම කාරක සභාව උත්තරීතර මණ්ඩලය වනු ඇත.

ආ. පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, නීතිරීති හා සාමාජිකයන්ගේ විනය පද්ධතිය ආදිය ක්‍රියාකාරීව රැක ගැනීම, ඒ අනුව අවශ්‍ය පරිදි නිලතල වලින් නිලධාරීන් නෙරපීම, තනතුරු කිරීම, පක්ෂයෙන් නෙරපීම, අනුබද්ධිත තත්ත්වයන් අහෝසි කිරීම ආදි ක්‍රියා මාර්ග ගැනීමට අවසාන තීරණය මධ්‍යම කාරක සභාව සතු වේ.

ඇ. අවශ්‍යතා අනුව නාම යෝජනා මණ්ඩලය ඇතුළු විවිධ මණ්ඩල හා කමිටු පත් කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

ඈ. පක්ෂයේ දිස්ත්‍රික් බල මණ්ඩල වලට පහළ කවරම සංවිධානයක හෝ ඒවායේ සාමාජිකයෙකුගේ හෝ නිලධාරියෙකුගේ හෝ නියෝජිතයෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග නිර්ණාවලට පටහැනි යැයිද නැතහොත් පක්ෂයට හානිකර යැයිද ඒත්තු ගියවිට එම සංවිධානයේ හෝ සාමාජිකයාගේ හෝ නියෝජිතයාගේ වැඩ තාවකාලිකව නතර කිරීමේ. සහ විනය මණ්ඩලයේ විනය පරීක්ෂණයකින් අදාළ පක්ෂ සාමාජිකයා වැරදිකරු වේ නම් ඔහු හෝ ඇය පහරවීමේ  බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

ඉ. එසේ යම් සාමාජිකයෙකුගේ හෝ සංවිධානයක වැඩ කටයුතු තාවකාලිකව නතනම් කරනු ලැබූ අවස්ථාවක එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිළිවිධාන යෙදීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

ඊ. විවිධ අංශයන් පිළිබඳව විශේෂ දැනුමක් සහිත පුද්ගලයන් ඇතුළත් උපදේශක සභාවක් පත් කිරීම මධ්‍යම කාරක සභාව සතු වගකීමක් වන අතර. එහි කාර්ය භාර්ය මධ්‍යම කාරක සභාව විසින් නිර්ණය කරනු ඇත.

උ. දේශපාලන බල මණ්ඩලය හෝ වෙනත් පක්ෂ සභාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ඕනෑම යෝජනාවක් සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

ඌ. පක්ෂයේ නම. සලකුණ. වර්ණය. ලිපිනය සහ ව්‍යවස්ථාවේ අනෙක්  කරුණු වෙනස් කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය. එහි ඡන්ද බලය හිමි සාමාජිකයන් 09 දෙනාගෙන් බහුතර අනුමැතිය ප්‍රමාණවත් වන අතර එය පක්ෂයේ සභාපති සහ මහලේකම් විසින් අත්සන් සහිතව සහතික කළ යුතුය.

**මධ්‍යම කාරක සභාව රැස්කිරීම සහ මූලාසනය**

අ. මධ්‍යම කාරක සභාව අවම වශයෙන් මාස තුනකට (03) වරක් හෝ රැස්විය යුතුය.

ආ. මධ්‍යම කාරක සභාව රැස් කළ යුත්තේ පක්ෂයේ මහලේකම්වරයා විසිනි.

ඇ. මධ්‍යම කාරක සභා රැස්වීමේදී මුලසුන පක්ෂයේ සභාපතිවරයා විසින් දැරිය යුතුය. මහලේකම්වරයා පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයේ සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියාකරනු ඇත.

ඈ. පක්ෂයේ සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක මධ්‍යම කාරක සභාව රැස්කිරීමට ප්‍රධාන ලේකම්වරයාට උපදෙස් දිය හැක.

ඉ. පක්ෂයේ මධ්‍යම කාරක සභාව තුළ යම් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ ගැටළු සහගත තත්වයක් මතු වුවහොත් ඒ සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතුය. එම ඡන්ද විමසීම් පැවැත්වෙන විටකදී මධ්‍යම කාරක සභාවේ සියලු සාමාජිකයන් ඊට සහභාගි විය යුතුය.

ඊ. මධ්‍යම කාරක සභාව ගනු ලබන සෑම තීරණයක්ම ලිඛිතව සකස් කිරීමට පක්ෂයේ මහලේකම් ක්‍රියා කළ යුතු අතර, එම ලේඛනයට පක්ෂයේ සභාපතිගේ අත්සන යෙදූ විට එම තීරණය වලංගු තීරණයක් බවට පත්වේ.

උ. පක්ෂයේ සභාපතිවරයා නොමැතිව කිසිදු තීරණයක් ගැනීමට මධ්‍යම කාරක සභාවට බලය නොමැත.

ඌ. නමුත් යම් හදිසි තත්ත්වයක් තුළදී සභාපතිවරයාට මධ්‍යම කාරක සභාවේ ඡන්ද අයිතිය ඇති සභිකයින් 03 දෙනෙකු සමඟින් පක්ෂයට අදාළ ඕනෑම තීරණයක් ගැනීමට බලය ඇත්තේය.

## III වන පරිච්ඡේදය

**මධ්‍යම කාරක සභා සහ දේශපාලන බල මණ්ඩල සභික සාමාජිකයෙකු සම්බන්ධ වෙනත් විධි විධාන**

<u>ධුරය අහෝසි වීම</u>

i. යම් මධ්‍යම කාරක සභා හෝ දේශපාලන බල මණ්ඩල සභිකයෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, පක්ෂ විනය උල්ලංඝනය කරනු ලැබී යැයි හැඟෙන විටක හෝ පක්ෂයේ උන්නතියට පක්ෂයේ පොදු සමගියට කීර්තියට හානි කර අයුරින් ක්‍රියාත්මක වේ යැයි පෙනෙන අවස්ථාවකදී, විනය මණ්ඩලය මගින් පවත්වන විනය පරීක්ෂණයකින් වැරදිකරු වූ පසු, පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සම්මත වීමෙන් පසු

පක්ෂයේ සභාපතිවරයාට පක්ෂයේ ඕනෑම දේශපාලන බල මණ්ඩල සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කළ හැක.

ii. මධ්‍යම කාරක සභා හෝ දේශපාලන බල මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සිටියදී, රට වාසනා නොවන යම් බරපතළ අපරාධ වරදක් සම්බන්ධයෙන් අධිකරණයකදී වැරදිකරු වන අයෙකු, අභියාචනයකින් නිදොස් කොට නිදහස් කරන තුරු, ධූරයෙන් ඉවත් කිරීමට පක්ෂයේ සභාපතිවරයා ක්‍රියාකළ යුතුය.

<u>දේශපාලන බල මණ්ඩල හෝ මධ්‍යම කාරක සභා සභිකයකුගේ ධූරකාලය</u>

i. සභාපතිවරයා හැරුණු කොට සියලු මධ්‍යම කාරක සභා හෝ දේශපාලන බල මණ්ඩල සාමාජිකයන්ගේ ධූර කාලය වසර හතකි. (07)

ii. එම කාලය අවසන් වීමට මාස හයකට (06) පෙර කාල සීමාව තුල හෝ ඉන් පසුව පැවැත්වෙන පක්ෂයේ මහා සම්මේලනයේදී වසර හයක (06) ධූර කාලයක් සම්පූර්ණ කර ඇති සභිකයන්ගේ නම් නැවත යෝජනා කොට සම්මත කොට තවත් වසර හතක (07) කාලයක් සඳහා නැවත පත් කිරීමට හැකියාව ඇත.

iii. එම යෝජනා පක්ෂයේ මහා සම්මේලනය විසින් සම්මත කරනු නොලැබුවහොත් පක්ෂයේ සභාපතිවරයා විසින් නියමිත ක්‍රියා පටිපාටිය අනුව නව දේශපාලන බල මණ්ඩල සභිකයන් හෝ මධ්‍යම කාරක සභිකයන් තෝරා ගැනීමට ක්‍රියා කළ යුතුය.

<u>පුරප්පාඩු පිරවීම</u>

i යම් හේතුවකින් මධ්‍යම කාරක සභාවේ හෝ දේශපාලන බල මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විගාම පක්ෂයේ සභාපති විසින් දින තුනක (03) කාලයක් තුළදී පක්ෂ සමාජිකයෙකු තාවකාලිකව එම පුරප්පාඩුවට පත්කළ යුතුය.

ii පසුව ඔහුව හෝ ඇයව ස්ථිර සාමාජිකයෙකු බවට පත් කිරීම මධ්‍යම කාරක සභාවේ යෝජනා සම්මතයකින් කළ හැකිය.

29 APR 2026

## IV පරිච්ඡේදය

**ලක්ජන පෙරමුණ පක්ෂයේ සභාපති සහ ප්‍රධාන නිලධාරීන්**

**1. පක්ෂයේ සභාපති**

i). මෙම ව්‍යවස්ථාවේ පරිච්ඡේදයන්හි පක්ෂයේ සභාපතිවරයාට ක්‍රියාත්මක කළ හැකි යම් යම් බලතල සඳහන්ව ඇත. මෙම ව්‍යවස්ථාවේ සඳහන්ව නොමැති කරුණු සඳහා තීරණ ගැනීමේ අයිතිය පක්ෂ සභාපති වරයාට පැවරේ.

ii). පක්ෂයේ සභාපතිවරයා මිය ගිය විටක හෝ සිය ධූරයෙන් ඉල්ලා අස්වූ විටක හෝ පක්ෂ මහලේකම් විසින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව මසක් ඇතුළත රැස් කර, මධ්‍යම කාරක සභාවෙන් තාවකාලික සභාපතිවරයෙකු පත් කර ගත යුතු අතර, ඔහු පක්ෂයේ වැඩ බලන සභාපතිවරයා වශයෙන් ක්‍රියා කරනු ඇත.

iii). ඉන්පසු මාස හයක (06) කාළයක් ඇතුළතදී පක්ෂයේ මහා සම්මේලනයක් කැඳවීමට පක්ෂ මහලේකම්වරයා ක්‍රියාකළ යුතු අතර, එහිදී පක්ෂයට නව සභාපතිවරයෙකු හෝ තාවකාලික සභාපති වශයෙන් පත්කරගත් සභාපතිවරයා ''සභාපති'' වශයෙන් තෝරා ගැනීම කළ යුතුය. ඔහු පක්ෂයේ නව සභාපතිවරයා වන අතර, පක්ෂයේ පෙර පක්ෂ සභාපතිවරයා ලැබූ "යාවජීව නායකත්ව වරප්‍රසාදය ඔහුට ද හිමි වනු ඇත.

**2. පක්ෂයේ මහලේකම්**

i). මෙම තනතුර දරන්නා පක්ෂයේ සභාපති විසින් තෝරා ගනු ඇත.

ii). පක්ෂ මහලේකම්වරයාට පක්ෂයේ ප්‍රධාන සංවිධායක නැතහොත් ජාතික සංවිධායක පත් කිරීමේ බලය ඇත.

iii). පක්ෂයේ මහලේකම් ධූරයේ කාල සීමාව වසර අටකි. (08) මහලේකම්වරයා අඛණ්ඩව පක්ෂයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාකරන්නේ නම් සභාපතිවරයාට ඔහුගේ කාලය දීර්ඝ කිරීමේ බලය ඇත.

iv). පක්ෂයේ මහලේකම්වරයා ඉල්ලා අස්වූ විටක, අස් කරනු ලැබූ විටක හෝ මිය ගිය විටක පක්ෂයේ සභාපති විසින් ප්‍රධාන ලේකම්වරයෙකු දින හතක් (07) ඇතුළත පත් කර ගත යුතුය.

v. පක්ෂයේ මහලේකම්වරයා පක්ෂයේ මධ්‍යම කාරක සභාව කැඳවා එහි මූලාසනයේ කටයුතු කරනු ඇත.

vi. සෑම පක්ෂ මහා සම්මේලනයකදීම පක්ෂයේ එතෙක් ක්‍රියාකාරීත්වය සම්බන්ධ පරිපූර්ණ වාර්තාවක් මහලේකම්වරයා විසින් සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

vii. පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය අතර, මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමේ වගකීම පක්ෂයේ මහ ලේකම් සතුය.

viii. පක්ෂයේ මහලේකම්වරයා විසින් පක්ෂයේ දේශපාලන බල මණ්ඩල සහ මධ්‍යම කාරක සභා තීරණයන් සභාපතිවරයාගේ අත්සන් සහිතව ලිඛිතව පක්ෂයේ පහළ මණ්ඩලයන්ට යොමු කළ යුතුය.

ix. පක්ෂයේ පහළ මණ්ඩලයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ලිඛිත වාර්තා පවත්වාගෙන යාම පක්ෂයේ මහලේකම්වරයා සතු වගකීමක් වේ.

x. පක්ෂයේ මහලේකම්වරයා පක්ෂයේ අභිවෘද්ධියට එරෙහිව, පක්ෂ ව්‍යවස්ථාවට පටහැනිව, සාමූහිකත්වයට හා සමගියට එරෙහිව සහ හෝ වංචනිකව ක්‍රියා කරන බවට සනාථ වූ අවස්ථාවක ඔහු ඉවත් කර වෙනත් අයෙකු මහලේකම් ධුරයට පත්කිරීමේ බලය පක්ෂයේ සභාපතිවරයා සතුවේ.

**3. පක්ෂයේ භාණ්ඩාගාරික**

i. මෙම තනතුර දරන්නා පක්ෂයේ සභාපති විසින් හෝ තෝරා ගනු ඇත. එම පත් කිරීම පක්ෂයේ මහා සම්මේලනයේ දී බහුතර ඡන්දයෙන් අනුමත විය යුතුය.

ii. මොහු පක්ෂයේ සෑම අරමුදලක් සම්බන්ධයෙන්ම ගිනුම් වාර්තා පවත්වාගෙන යා යුතු අතර, පක්ෂයේ අරමුදල් සම්බන්ධ පූර්ණ වාර්තාවක් පක්ෂ මහා සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

iii. පක්ෂයේ සෑම පහළ සංවිධානයකම, සෑම අනුබද්ධිත අරමුදල් සම්බන්ධයෙන් වූ වාර්තාවක් සෑම මාස හයකට (06) වරක්ම පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

iv). පක්ෂයේ අරමුදල් ශක්තිමත් කිරීම උදෙසා වූ ක්‍රියාමාර්ග සොයා බලා පක්ෂයේ දේශපාලන බල මණ්ඩලයට ඉදිරිපත් කිරීම ද භාණ්ඩාගාරික සතු වගකීමයි.

v). පක්ෂයේ අරමුදල් සහිත ජංගම ගිනුම් හා ස්ථාවර ගිනුම් වලින් මුදල් ලබා ගැනීමේ දී භාණ්ඩාගාරික සහ සභාපති දෙදෙනාම අත්සන් කළ යුතු වේ.

vi). පක්ෂයේ නමින් බැංකු ගිනුමක් විවෘත කිරීමට සභාපති සහ භාණ්ඩාගාරික අනුමැතිය ප්‍රමාණවත් වේ.

### V වන පරිච්ඡේදය

## ලක්ජන පෙරමුණ පක්ෂයේ මහා සම්මේලනය

**1. පක්ෂයේ මහා සම්මේලනය - කැඳවීම/ මූලාසනය/ කාලය**

පක්ෂ මහා සම්මේලනය වර්ෂයකට වරක් කැඳවිය යුතුය.

පක්ෂ සම්මේලනය පවත්වනු ලබන දිනය පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

පක්ෂයේ මධ්‍යම කාරක සභාවට විශේෂ මහා සම්මේලනයක් කැඳවීමට බලය ඇත.

පක්ෂයේ මහා සම්මේලනයේ මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතුය.

පක්ෂයේ මහා සම්මේලනය කැඳවනු ලබන්නේ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණයට අනුව පක්ෂ මහලේකම්වරයා විසිනි.

යම් මැතිවරන කොට්ඨාසයක හෝ යම් මැතිවරන දිස්තික්කයක් තුළ හෝ පක්ෂ මහා සම්මේලනය කැඳවත අවස්ථාව වන විට අවශ්‍ය සංවිධාන ගොඩ නැංවීමට හැකියාව නොලද හොත් ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා දිස්ත්‍රික් සංවිධායකවරුන් පත්කිරීමට පක්ෂයේ සභාපතිවරයාට බලය පැවරේ. නියමිත සංවිධාන ජාළය ගොඩ නැගු පසුව පැවැත්වෙන පක්ෂ මහා සම්මේලනයෙදී එ සියලු පත්කිරීම් සම්මත විම හෝ වෙනත් අය ඒ සඳහා පත් කිරීම සිදු කළ යුතුය.

## 2. පක්ෂයේ මහා සම්මේලනය සඳහා සහභාගී වන නියෝජිතයින්

i. පක්ෂයේ මධ්‍යම කාරක සභිකයන්
ii. පක්ෂයේ දේශපාලන බල මණ්ඩල සාමාජිකයන්
iii. මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයන්හි ලේකම්/ සභාපති/ භාණ්ඩාගාරික නිල දරන්නන් ඇතුළු පස් දෙනෙකු (05) බැගින්
iv. දිස්ත්‍රික් තරුණ සංවිධානයන්හි සභාපති / ලේකම්
v. දිස්ත්‍රික් කාන්තා සංවිධානයන්හි සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික තනතුරු දරන්නන්
vi. පක්ෂයේ සෑම අනුබද්ධ සංවිධානයකම සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික නිල දරන්නන් ඇතුළු පස් දෙනෙකු (05) බැගින්
vii. තරුණ සංවිධානයේ මධ්‍ය කමිටුවේ නිලධාරින් සහ කාන්තා සංවිධානයේ මධ්‍ය කමිටුවේ නිලධාරිනියන්
viii. සියලුම මැතිවරණ කොට්ඨාස සංවිධායකවරුන් සහ දිස්ත්‍රික් සංවිධායකවරුන්
ix. සභාපතිවරයාට අමතරව සියලුම මැතිවරණ කොට්ඨාස සංවිධානයන්හි ලේකම් ඇතුළු තිදෙනෙකු (03)
x. පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්
xi. පක්ෂ සාමාජිකයින්

## 3. පක්ෂ මහා සම්මේලනයේ කාර්යභාර්ය

i. මෙය පක්ෂයේ සියලුම අංශයන්හි නියෝජිතයින් ඒකරාශි වන්නා වූ එකම සම්මේලනය වන බැවින් පක්ෂයේ වර්ධනය, ගමන් මාර්ගය, පක්ෂයේ සංවිධාන සහ සාමාජිකයන් සම්බන්ධයෙන් පුළුල් ලෙසින් සාකච්ඡාවට භාජනය කරන්නා වූත්, පක්ෂයේ සියලු අංශයන් තුළ මතවාදී එක්සත් භාවය ඇති කිරීම සඳහා ප්‍රධානතම වේදිකාව වශයෙනුත් ක්‍රියාත්මක විය යුත්තේය.

ii. පක්ෂයේ සභාපති, මහලේකම්වරයා, නියෝජ්‍ය මහලේකම්වරයා සහ පක්ෂයේ භාණ්ඩාගාරිකවරයා අවශ්‍ය අවස්ථාවන්හිදී පත් කර ගැනීමට මෙම සම්මේලනයේදී නියෝජිතයන් ක්‍රියාකළ යුතුය.

iii. මීට අමතරව පක්ෂයේ වර්ධනය සඳහා අවශ්‍ය යැයි හැඟෙන තීරණ සම්මත කර ගැනීමට මෙම සම්මේලනයේ නියෝජිතයන්ට හැකියාව ඇත.

iv. පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයන් සම්බන්ධයෙන් පක්ෂයේ මහා සම්මේලනයට කරුණු පැහැදිලි කිරීමට, විග්‍රහ කිරීමට පක්ෂයේ සභාපතිවරයා කටයුතු කළ යුතුය. එම තීරණ සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයේදී විවෘතව තම අදහස් ප්‍රකාශ කිරීමට සෑම නියෝජිතයෙකුටම අයිතිය ඇත්තේය. නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන එම අදහස් සම්බන්ධයෙන් පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය සැලකිලිමත් වීමට බැඳී සිටී.

## VI වන පරිච්ඡේදය

### විශේෂ විධි විධාන

1. පක්ෂ සංවිධානයන් ක්‍රියාත්මක වන විටදී මතුවන්නා වූ යම් යම් ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාව තුළ අවශ්‍ය විධිවිධානයන් අඩංගු නොමැති නම් එම තත්ත්වය සම්බන්ධයෙන් පක්ෂයේ සභාපතිවරයාට ලිඛිතව දැන්විය යුතුය.

2. එය දැන්වීමේ බලය අදාළ සංවිධානයේ මහලේකම්වරයාට පැවරේ. එම ලිඛිතව දැන්වීම ලැබී සති දෙකක (02) කාලයක් ඇතුළතදී පක්ෂයේ සභාපතිවරයා ඇතුළු පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය අවශ්‍ය නව විධිවිධානයන් ඇතුළත් කිරීමට ක්‍රියා කළ යුතුය. ඒ අන්දමින් පක්ෂයේ දේශපාලන බල මණ්ඩලය විසින් නිගමනය කරන්නා වූ නව ව්‍යවස්ථා අංගයන් සම්බන්ධයෙන් නිවේදනයක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට සහ පක්ෂයේ අනිකුත් සංවිධානයන්ට වහාම නිකුත් කිරීමට පක්ෂයේ මහ ලේකම්වරයා ක්‍රියාකළ යුතු අතර පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඒ පිළිබඳව පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කිරීමට පක්ෂයේ මහලේකම්වරයා බැඳී සිටී.

3. ඉන්පසුව ඊළඟ පක්ෂ මහා සම්මේලනයේදී එම පනවනු ලැබූ නව විධි විධානයන් සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයට කරුණු ඉදිරිපත් කොට එම විධිවිධානයන් සඳහා පක්ෂ සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂයේ සභාපතිවරයා ක්‍රියාකළ යුතුය. ඉන්පසු ඒ නව විධිවිධාන පක්ෂ ව්‍යවස්ථාවට අන්තර්ගත වනු ඇත.

4. මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් විධිවිධානයන් භාවිතාවේදී මෙම ව්‍යවස්ථාවේම අන්තර්ගත වන්නා වූ තවත් විධිවිධානයන් සමගින් යම් ප්‍රති විරෝධී ස්වරූපයක් පෙන්නුම් කරන්නා වූ විටකදී ඒ පිළිබඳව සාකච්ඡා කොට නිගමන වලට එළැඹීමේ බලය පක්ෂයේ මධ්‍යම කාරක සභාව සතු වන අතර අවසන් තීරණය දෙනු ලබන්නේ සභාපතිවරයා විසිනි.

5. මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් වගන්තියක් සම්බන්ධයෙන් අර්ථ නිරූපනයේදී යම් අපහසුතාවයක් පවතිනම් එය විග්‍රහ කිරීමේ සහ තේරුම් කිරීමේ බලය පක්ෂයේ මධ්‍යම කාරක සභාව සතු වේ.

6. මෙම ව්‍යවස්ථා සංශෝධනය මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තුරු පැවැත්වෙන ඕනෑම මැතිවරණයකදී පක්ෂයේ දියුණුවට අදාළව පෙර ව්‍යවස්ථා පරිදි තීරණ ගනු ලැබීමට පක්ෂ සභාපතිවරයාට බලය ඇත.

7. මෙම ව්‍යවස්ථාව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කළ යුතු අතර. එම පරිවර්තනයන් සහ මෙම ව්‍යවස්ථාව අතරේ යම් පරස්පරතාවයක් පවතී නම් එවිට පිළිගත යුත්තේ මෙම සිංහල ව්‍යවස්ථාවය.